*සැ. යු.* - 2008.02.01 දින පළ කරන ලද 1535 දරන *ගැසට් පත්‍රයේ* II හා III කොටස් පළ නොවීය.
- මෙවර පළවන *ගැසට් පත්‍රයේ* V කොටසේ 2003 වර්ෂයේ අප්‍රේල්-ජූනි කාර්තුවට අදාල මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,536 - 2008 පෙබරවාරි මස 08 වැනි සිකුරාදා - 2008.02.08**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 94 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 96 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 96 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 104 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම් දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ නරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 පෙබරවාරි මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 පෙබරවාරි මස 01 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2008 අංක 64

DRF/21/RECT/2522.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2007 මාර්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් පුස්සේවලගේ අර්ජුන නිශාන්ත ද සිල්වා ශ්‍රීලපාහ (නි/62320)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 17 වැනි දින,
කොළඹ දී ය.

02-209

2008 අංක 65

DRF/21/RECT/2530.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2007 අප්‍රේල් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (උපකරණ පාලක) අමරපති මුදලිගේ නීල් සමන්ජිත් විජේසිරිවර්ධන ශ්‍රීලයුවෛබ (නි/63758)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 17 වැනි දින,
කොළඹ දී ය.

02-211

2008 අංක 66

DRF/21/RECT/2521.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2007 අප්‍රේල් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් සකලසූරිය මුදියන්සේලෑ සේනක බංඩාර සකලසූරිය ශ්‍රීලංසංබ (නි/63597)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 17 වැනි දින,
කොළඹ දී ය.

02-210

2008 අංක 67

DR/21/RECT/2480/F.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

**අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්**

පහත නම සඳහන් නිලධාරි 2006 දෙසැම්බර් මස 31 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් කස්තුරි ආරච්චිගේ ජයතිස්ස ශ්‍රීලසසබ (නි/63268)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

02-276

2008 අංක 68

D/22/NY/413.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2007 ඔක්තෝබර් මස 20 දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගන්වා ඇත.

කොමදෝරු තොම්මාදුර මනිල් ජයන්ති මෙන්ඩිස්, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0116

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ඔක්තෝබර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

02-215

---

2008 අංක 69

D/RF/824/NY/02/03.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2007 ජූලි මස 01 වැනි දින සිට තාවකාලික කොමාණ්ඩර් (සිඉ) වශයෙන්*

ලුතිනන් කොමාණ්ඩර් (සිඉ) ඩිලාන් සේනානායක, ශ්‍රීලංනාහ - එන්ආර්සී 0668

ලුතිනන් කොමාණ්ඩර් (සිඉ) මැදගොඩ ජයසිංහලාගේ රන්ජන් රවීන්ද්‍ර මැදගොඩ, ශ්‍රීලංනාහ - එන්ආර්සී 0670

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 නොවැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

02-214

---

2008 අංක 70

D/RF/824/N/1/6.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2007 අගෝස්තු මස 04 වන දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන්*

ලුතිනන් වීරසිංහ ඕකන්දගේ නලින්ද කුමාර, එන්ආර්එක්ස් 1041, ශ්‍රීලංනාහ

*2007 අගෝස්තු මස 11 වන දින සිට තාවකාලික ලුතිනන් කොමාන්ඩර් වශයෙන්*

ලුතිනන් නිශ්ශංක ආරච්චිලාගේ රොෂාන් චමින්ද නිශ්ශංක, එන්ආර්එක්ස් 1039, ශ්‍රීලංනාහ

*2007 අගෝස්තු මස 13 වන දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන්*

ලුතිනන් දිසානායක මුදියන්සේලාගේ චන්ද්‍ර ලංකානාථ බංඩාර දිසානායක, එන්ආර්එක්ස් 1074, ශ්‍රීලංනාහ

*2007 අගෝස්තු මස 13 වන දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන්*

ලුතිනන් (ඉ) සසිදු නාලක ද සිල්වා අබේසූරිය, එන්ආර්ඊ 1081, ශ්‍රීලංනාහ

*2007 අගෝස්තු මස 18 වන දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන්*

ලුතිනන් ජනක බන්ඩාර හෙට්ටිආරච්චි, එන්ආර්එක්ස් 1050, ශ්‍රීලංනාහ

*2007 අගෝස්තු මස 27 වන දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (විආ) වශයෙන්*

ලුතිනන් (විආ) සිවනෙත්ති ප්‍රදීප් නලීන් කුමාර, එන්ආර්ආර් 1088, ශ්‍රීලංනාහ

*2007 සැප්තැම්බර් මස 03 වන දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ) වශයෙන්*

ලුතිනන් (නාසෙ) හිටිනායක මුදියන්සේලාගේ ප්‍රසන්න සුමේධ බංඩාර හිටිනායක, එන්ආර්පී 1089, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 නොවැම්බර් මස 12 දින,
කොළඹ දී ය.

02-275

---

D/DISC/NY/07/98.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

2007 අගෝස්තු මස 08 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදා ස්ථිර බලකායේ පහත නම සඳහන් නිලධාරියා

අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

ලුතිනන් (නාසෙ) දොන් නානායක්කාරවසම් ඥාණසිංහ ඕපාත, එන්ආර්පී 1027, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ඔක්තෝබර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

02-212

D/RF/RECT/914/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් මුදා හැරීම

2007 නොවැම්බර් මස 11 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදා ස්ථිර බලකායේ පහත නම සඳහන් නිලධාරියා අධිකාරියෙන් මුදා හැරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

ලුතිනන් (ඉ) වීරතුංග ආරච්චි ප්‍රදීප් කපිල නිශාන්ත, එන්ආර්ඊ 1806, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ඔක්තෝබර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

02-213

---

# ආණ්ඩුවේ නිවේදන

**රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය**

2006.01.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ මත රාජ්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ පහත සඳහන් තනතුරු සංශෝධනය කර තිබේ :

| *දෙපාර්තමේන්තුව* | *තනතුරු නාමය* | *සංශෝධිත තනතුරු නාමය* |
|---|---|---|
| ගොඩනැගිලි | අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ ජනරාල් |
| ගොඩනැගිලි | අතිරේක අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ ඉංජිනේරු (ගොඩනැගිලි) |

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 269/2 හා 1984 මැයි මස 07 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 1984 අප්‍රේල් 30 දිනැති ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයට ආදේශ වශයෙන් 1988 ජූනි මස 07 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ උපලේඛනයේ සිවිල් කාණ්ඩ 1 (ගොඩනැගිලි) යටතේ තනතුරු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය අනුව ඉහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

02 - 245

---

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය,
රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

**වාර්ෂික ගිණුම් 2004**

***කළමනාකරණ මණ්ඩලයේ සමාලෝචනය***

01. *අරමුණ.* – අරමුදලේ අරමුණ හා පරමාර්ථය වනුයේ විශ්‍රාම වැටුප් රහිත මාසික වැටුප් ලබන රාජ්‍ය සේවකයින් සඳහා අර්ථසාධක ක්‍රමයක් ඇති කිරීමයි. 2004.01.01 දින සිට විශ්‍රාම වැටුප් නොලබන හා කිසිදු සමාජ ආරක්ෂණයක් නොමැති සියලුම රාජ්‍ය සේවකයින් සඳහා මෙම අරමුදලේ ප්‍රතිලාභ ලබා ගැනීම ව්‍යාප්ත කර ඇත.

02. *කාර්යයන්*

අරමුදලේ ප්‍රධාන කාර්යයන් වනුයේ,

(*අ*) රජයේ විවිධ දෙපාර්තමේන්තු හා විදේශ තානාපති කාර්යාලවල සේවය කරන විශ්‍රාම වැටුප් අහිමි මාසික වැටුප් ලබන රාජ්‍ය සේවකයින්ගේ මාසික වැටුපෙන් 8% දායක මුදලක් අයකර අරමුදලට බැර කිරීම ;

(*ආ*) එම අයකරනු ලබන මුදල් පිළිබඳ වාර්තා ගෙන්වා ගැනීම, එම තොරතුරු සටහන් කර තැබීම හා දායක මුදල් නිසි පරිදි අරමුදලට බැර කිරීම ;

(*ඇ*) එක් එක් වර්ෂයක් අවසානයේ දායකයන්ගේ ගිණුම්වල ඇති ශේෂයන් ඔවුන් වෙත දැන්වීම හා ඔවුන්ගේ දායකත්වය අවසන් වූ වහාම ඔවුන්ට හිමි ප්‍රතිලාභයන් කඩිනමින් ලබා දීම ;

(*ඈ*) අරමුදලට එකතුවන හා අතිරික්ත වන මුදල් දායකයින්ට වැඩි පොලියක් ගෙවිය හැකි වන පරිදි රජයේ සුරකුම්පත්වල ආයෝජනය කිරීම හා වර්ෂය අවසානයේ දී දායකයින්ගේ ගිණුම්වලට පොලී විසර්ජනය කිරීම.

03. *මූල්‍ය මෙහෙයුම.* – සමාලෝචිත වර්ෂය තුළ අරමුදලට ලැබුණු අනිවාර්ය දායකය හා රජයේ දායකය පිළිවෙලින් රු. 225,527,179 ක් හා රු. 251,412,810 ක් වූ අතර 2003 වර්ෂය තුළ එය පිළිවෙලින් රු. 168,148,320 ක් හා රු. 243,607,780 ක් විය. අරමුදලේ මූල්‍ය සම්පත් ආයෝජනය කිරීමෙන් වර්ෂය තුළ ඉපයූ මුළු ආදායම රු. 978,461,203 ක් වූ අතර පසුගිය වර්ෂයේ මෙය රු. 877,860,313 කි. මෙහි වර්ධනය 11.46% ක් පෙන්නුම් කරන අතර අරමුදල මෙහෙයවීම සඳහා දැරූ පරිපාලන වියදම රු. 3,930, 488 ක් අඩු කිරීමෙන් පසු වියදම ඉක්ම වූ ආදායම රු. 974,530,714 ක් වූයෙන් දායකයින් සඳහා ගෙවිය හැකි වූ පොළී ප්‍රතිශතය 10.34%ක් විය. පසුගිය වර්ෂයේ මෙය 10.51% කි. ආසන්න කාර්තු ප්‍රතිශතය වූ 10.25%ක් එනම් රු. 966,.279,838 ක මුදලක් විසර්ජනය කිරීමෙන් පසු රු. 8,250,877 ක අතිරික්තයක් ඇති වූ අතර එය පොදු සංචිත ගිණුමට මාරු කරන ලදී.

04. *ගිණුම් ප්‍රතිපත්ති*

(*අ*) *ගිණුම්කරණ පදනම.* – මූල්‍ය ප්‍රකාශන පිළිගත් ගණකාධිකරණ සම්මත මූලධර්මවලට අනුව හා 1942 අංක 18 දරන රා. සේ.අ. අ. ආඥා පනත අනුව පිළියෙල කරන ලදී.

(*ආ*) *ගොඩනැගිලි කුළී විදුලිය හා ජල ගාස්තු.*– විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ගෙවනු ලබන ගොඩනැගිලි කුළී, විදුලි ගාස්තු හා ජල ගාස්තු 1993 වර්ෂයේ සිට අරමුදල විසින් දැරීමට මණ්ඩලය විසින් තීරණය කරන ලදී. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ගෙවන ලද මෙම වියදම් පහත පරිදි විභජනය කර ඇත :

| *වියදම* | *පදනම* |
|---|---|
| ගොඩනැගිලි කුළී හා විදුලිය | භූමි ප්‍රමාණය |
| ජලය | සේවක සංඛ්‍යාව |

(*ඇ*) *ස්ථාවර වත්කම් හා ක්ෂය ප්‍රතිපාදන*

1. ස්ථාවර වත්කම් ගත් මිලට අගය කොට ඇත.
2. ස්ථාවර වත්කම් මිල දී ගත් වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදන නොකරන අතර විකිණීම් කරනු ලබන වර්ෂය වෙනුවෙන් ක්ෂය ප්‍රතිපාදන කරනු ලැබේ.
3. ක්ෂය වීම් කරනු ලබන්නේ හීනවන ශේෂ ක්‍රමය පදනම් කරගෙනය. පහත සඳහන් පරිදි ප්‍රතිශතයන් අනුගමනය කරනු ලැබේ :

| | *ප්‍රතිශතය* |
|---|---|
| පරිගණක යන්ත්‍ර | 15% |
| කාර්යාල උපකරණ | 10% |
| ලී බඩු සවි කිරීම | 10% |

(*ඈ*) *ආදායම් හඳුනා ගැනීම.*– පොළී ආදායම
ලැබිය යුතු ආදායම් හඳුනාගැනීම උපචිත පදනම මත කර ඇත.

(*ඉ*) *ආයෝජන*
ශේෂ පත්‍ර දිනට ආයෝජනවල වටිනාකම පිරිවැයට අගය කර ඇති අතර වෙළඳ අගය ද ගණනය කර ගිණුම්වල දක්වා ඇත.

05. *මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්.*–

| | *2004* | *2003* |
|---|---|---|
| 01. පොළී ආදායම් | | |
| වර්ෂය තුල පොළී ලැබීම් | 942,581,543 | 836,855,571 |
| ප්‍රාග්ධන ලාභ/අලාභ | 1,299,202 | |
| | 943,880,745 | |

| | 2004 | 2003 |
|---|---|---|
| *අඩුකළා* : – | | |
| ජනවාරි 01 දිනට ලැබිය යුතු පොළිය | 303,352,468 | 262,347,726 |
| වර්ෂයට අදාළව ලැබුනු පොළිය | 640,528,277 | 574,507,845 |
| *එකතු කළා* : – | | |
| දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොළිය : | | |
| 01. රුපියල් ණය | 188,423,020 | 254,667,004 |
| 02. භාණ්ඩාගාර බිල්පත් | 49,190,234 | 34,372,928 |
| 03. භාණ්ඩාගාර බැඳුම්කර | 100,319,671 | 14, 312,536 |
| | 337,932,925 | 303,352,468 |
| වර්ෂයට අදාළ පොළිය | 978,461,202 | 877,860,313 |

02. *ස්ථාවර වත්කම්*

| *පිරිවැය* | *ලීබඩු හා සවි කිරීම්* | *කාර්යාල උපකරණ* | *පරිගණක උපකරණ* | *මුළු අගය* |
|---|---|---|---|---|
| 2004.01.01 දිනට ශේෂය | 48,946 | 631,577 | 385,282 | 1,065,805 |
| 2004.12.31 දිනට ශේෂය | 48,946 | 631,577 | 385,282 | 1,065,805 |
| *සමුච්චිත ක්ෂය* | | | | |
| 2004.01.01 දිනට ශේෂය | 19,673 | 268,329 | 156,283 | 444,285 |
| වර්ෂය අය කිරීම් | 2,927 | 36,325 | 34,350 | 73,602 |
| 2003.12.31 දිනට සමුච්චිත ක්ෂය | 22,600 | 303,654 | 190,633 | 517,887 |
| 2004.12.31 දිනට ශුද්ධ පොත් වටිනාකම | 26,346 | 326,923 | 194,649 | 547,918 |
| 2003.12.31 දිනට ශුද්ධ පොත් වටිනාකම | 29,273 | 363,248 | 228,999 | 621,520 |

03. *ආයෝජන*

ශ්‍රී ලංකා මහ බැංකුවේ කර ඇති ආයෝජනවල ගත් මිල රුපියල් මිලියන 9,985 ක් වූ අතර වෙළඳ අගය රුපියල් මිලියන 10,306 ක් විය.

04. *ලැබිය යුතු රජයේ දායක මුදල.* – මින් නිරූපණය වන්නේ ඒකාබද්ධ අරමුදලින් අනිවාර්ය දායකය වන 8% ක ප්‍රමාණයට සාපේක්ෂව රජයෙන් ලැබිය යුතු 12%ක ප්‍රමාණය වන අතර වර්ෂ අවසානයේ නොලැබුණ ප්‍රමාණය මින් නිරූපණය වේ.

05. *ගැලපුම් ගිණුම.*– මෙම ගිණුමෙන් දක්වා ඇත්තේ වෙනත් දෙපාර්තමේන්තුවලින් කරනු ලබන සාවද්‍ය හර හා බැර කිරීම් වේ. මෙවැනි සාවද්‍ය හර හා බැර එම දෙපාර්තමේන්තුවලට දන්වනු ලබන අතර ඔවුන් නිවැරදි කිරීම් කළ පසු මෙම ශේෂයන් නිරවුල් වනු ඇත.

06. *සමුච්චිත අරමුදල.* – දායක ගිණුම් සඳහා බැරට ඇති ශේෂයන් මෙයින් නිරූපනය කරන අතර මෙහි අනිවාර්ය දායකය, ස්වේච්ඡා දායකය, රජයේ දායක මුදල හා මෙම කොටස් වලට අයත් පොළිය ද ඇතුළත් වේ.

07. *පොදු සංචිතය.*– මෙම ගිණුමෙන් දැක්වෙනුයේ ආසන්න ප්‍රතිශත කාර්තුව සඳහා පොළිය විසර්ජනය කිරීමෙන් අනතුරුව ඉතිරි වූ ශේෂයයි. මෙම වර්ෂයේ දී ආසන්න ප්‍රතිශත කාර්තුවට පොළිය විසර්ජනය කිරීමෙන් පසු ඉතිරි වූ රු. 8,250,877 ක් පොදු සංචිත ගිණුමට මාරු කරන ලදී.

08. *උපචිත වියදම්.* – සමාලෝචිත වර්ෂය තුළ ඒකාබද්ධ අරමුදලින් දැරූ වියදම් මින් නිරූපනය වන අතර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විදුලිය හා ජලය වෙනුවෙන් වියදම් කරන ලද රු. 161,294 ක මුදල ද මෙයට ඇතුළත් කර ඇත.

| | 2004 | 2003 |
|---|---|---|
| විදුලිය හා ජලය | 161,294 | 145,274 |
| පරිපාලන වියදම් | 3,405,623 | 3,260,349 |
| | 3,566,917 | 3,405,623 |

එස්. එන්. හපුආරච්චි,
රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල්
කළමනාකාර මණ්ඩලයේ
ලේකම් හා ගණකාධිකාරී.
2006 - ජූලි

කේ. ඒ. තිලකරත්න,
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය සේවා
අර්ථසාධක අරමුදල්,
කළමණාකාර මණ්ඩලයේ සභාපති,
2006 - ජූලි

**රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල**

2004.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම

| | | *2004* | | *2003* |
|---|---|---|---|---|
| ජනවාරි 01 දිනට හා. නි. ලේ. ශේෂය | | 632,442,588 | | 1,556,720,072 |
| *ලැබීම්* | | | | |
| අනිවාර්ය දායකය | 225,527,179 | | 168,148,320 | |
| රජයේ ප්‍රසාද මුදල් | 251,412,810 | | 243,607,780 | |
| පොළී ආදායම | 942,581,543 | | 836,855,571 | |
| සාවද්‍ය බැර | 92,130 | | 1,591,590 | |
| උපලබ්ධි වූ ආයෝජන | 5,406,270,275 | | 2,677,695,391 | |
| | 6,825,883,937 | | 3,927,898,652 | |
| *අඩු කළා* : – | | | | |
| ගෙවීම් | | | | |
| අනිවාර්ය දායකය | 40,598,357 | | 44,198,978 | |
| රජයේ දායකය | 32,040,617 | | 15,325,088 | |
| නොගෙවූ ප්‍රසාද මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම | 15,728,015 | | 46,386,224 | |
| පරිපාලන වියදම් | 3,395,592 | | 3,063,162 | |
| විගණන ගාස්තු | - | | 786,160 | |
| සාවද්‍ය හර | 5,840,104 | | 1,597,133 | |
| මූලධන වත්කම් වැඩිදියුණු කිරීම | - | | 491,129 | |
| ගැලපුම් (ආදායම් වියදම් ගිණුම) | - | | - | |
| ආයෝජන | 7,037,386,602 | | 4,740,328,262 | |
| | | (309,105,350) | | (924,277,484) |
| දෙසැම්බර් 31 දිනට හා. නි. ලේ. ශේෂය | | 323,337,238 | | 632,442,588 |

රා.සේ.අ.අ. වාර්ෂික ගිණුම් 2004

**රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල**

2004.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම

| | *සටහන* | *2004* | | *2003* | |
|---|---|---|---|---|---|
| *ආදායම්* : – | 1 | | | | |
| පොළී ආදායම් | | 1,023,565,692 | | 904,797,699 | |
| *අඩුකළා* : පොළී මත බදු (රඳවා ගැනීම්) | | 45,104,489 | | 26,937,386 | |
| | | | 978,461,203 | | 877,860,313 |
| *අඩුකළා* : වියදම් | | | | | |
| විදුලිය | | 112,209 | | 106,356 | |
| ජල ගාස්තු | | 49,085 | | 38,918 | |
| පුද්ගලික පඩි නඩි | | 3,135,234 | | 2,887,695 | |
| ගමන් වියදම් | | 860 | | 12,614 | |
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | | 33,525 | | 81,210 | |
| අලුත්වැඩියා හා නඩත්තු | | 25,555 | | 14,441 | |
| ප්‍රවාහන සම්බන්ධතා හා නිවාඩු දුම්රිය | | 177,630 | | 155,643 | |
| විගණන ගාස්තු | | 300,000 | | 262,086 | |
| ස්ථාවර වත්කම් ක්ෂය | | 73,602 | | 82,754 | |
| නිල ඇඳුම් | | 500 | | 2,938 | |
| තැපැල් ගාස්තු | | 21,858 | | 17,230 | |
| වෙනත් වියදම් | | 430 | 3,930,488 | 12,170 | 3,674,055 |
| වියදම ඉක්ම වූ ආදායම | | | 974,530,714 | | 874,186,258 |
| *අඩු කළා* : සාවද්‍ය හර හා බැර | | | | | 10,000,000 |
| විසර්ජනය කළ හැකි ආදායම | | | 974,530,714 | | 864,186,258 |

| | *සටහන* | | *2004* | | *2003* |
|---|---|---|---|---|---|
| දායකයන්ට පොළී විසර්ජනය කිරීම් | | | | | |
| අනිවාර්ය දායකය | | 386,542,332 | | 344,270,846 | |
| ස්වේච්ඡා දායකය | | 965,066 | | 894,664 | |
| රජයේ දායකය | | 578,772,440 | 966,279,838 | 517,800,825 | 862,966,335 |
| පොදු සංචිත ගිණුමට මාරු කළා | | | 8,250,877 | | 1,219,923 |

රා.සේ.අ.අ. වාර්ෂික ගිණුම් 2004

**රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල**

2004.12.31 දිනට ශේෂ පත්‍රය

| | *සටහන* | | *2004* | | *2003* |
|---|---|---|---|---|---|
| *වත්කම්* | | | | | |
| ජංගම නොවන වත්කම් : | 2 | | | | |
| ලීබඩු | | 26,346 | | 29,273 | |
| කාර්යාලීය උපකරණ | | 326,923 | | 363,248 | |
| පරිගණක යන්ත්‍ර | | 194,649 | | 228,999 | |
| | | | 547,918 | | 621,520 |
| ආයෝජන | 3 | | 9,985,171,722 | | 8,352,756,193 |
| *ජංගම වත්කම්* : | | | | | |
| ලැබිය යුතු ආයෝජන පොළී | | 337,932,925 | | 303,352,468 | |
| ලැබිය යුතු රජයේ දායකය | 4 | 90,490,948 | | 3,990,610 | |
| ගැළපුම් ගිණුම | 5 | 8,372,072 | | 2,624,097 | |
| භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමේ ශේෂය | | 323,337,238 | 760,133,183 | 632,442,588 | 942,409,763 |
| **මුලු වත්කම්** | | | 10,745,852,823 | | 9,295,787,476 |
| ස්කන්ධය හා වගකීම් : | | | | | |
| සමුච්චිත අරමුදල : | 6 | | | | |
| අනිවාර්ය දායකය | | 4,263,494,975 | | 3,692,023,821 | |
| ස්වේච්ඡා දායකය | | 10,380,345 | | 9,415,279 | |
| රජයේ දායකය | | 6,453,983,748 | 10,727,859,068 | 5,585,066,792 | 9,286,505,892 |
| සංචිත : | | | | | |
| ප්‍රාග්ධන සංචිතය | | 3,790 | | 3,790 | |
| පොදු සංචිතය | 7 | 13,861,011 | 13,864,801 | 5,610,134 | 5,613,924 |
| ජංගම වගකීම් : | | | | | |
| උපචිත විගණන ගාස්තු | | 562,037 | | 262,037 | |
| උපචිත ආයතන වියදම් | 8 | 3,566,917 | 4,128,954 | 3,405,623 | 3,667,660 |
| මුළු ස්කන්ධය හා වගකීම් | | | 10,745,852,823 | | 9,295,787,476 |

එස්. එන්. හපුආරච්චි,
රා. සේ. අ. අ. කළමනාකාර මණ්ඩලයේ ලේකම් හා ගණකාධිකාරී.
2006 ජූලි 21

කේ. ඒ. තිලකරත්න,
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් හා රා. සේ.
අ. අ. කළමනාකාර
මණ්ඩලයේ සභාපති.
2006 ජූලි 28

රා. සේ. අ. අ. වාර්ෂික ගිණුම් 2004

*විගණන මතය* : – රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2004 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනතේ (621) 24(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මෙම ගිණුම් පිළිබඳ මාගේ නිරීක්ෂණයන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ අමතන ලද සම දින දරන මාගේ වාර්තාවේ ඇතුළත්ව ඇත.

පී. ඒ. පේමතිලක,
විගණකාධිපති.

2007 පෙබරවාරි මස 12 වැනි දින,
කොළඹ 07, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ දීය.

**රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2004 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව**

මගේ අංකය ඒවයි/ජේ/ජීඑස්ජීඑෆ්/2004/2006/10.

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2004 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනතේ (621 අධිකාරය) 24(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 *විගණන විෂය පථය* : – මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලාව යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශයන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්, විධි සහ පරිචයන්ට අනුකූලව විගනණය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන සාක්ෂි පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේ දී අනුගමනය කරන ලද ගණකාධිකරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ නිගමන තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම් පිළිබඳ ඇගයීම් සහ යොදා ගන්නා ලද ගණකාධිකරණ ප්‍රතිපත්ති සුදුසු ද, ඒවා ඒකාකාරිව අනුගමනය කරන ලද්දේ ද සහ ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කරන ලද්දේදැයි නිගමනය කිරීම විගණනයට ඇතුළත් විය.

2. ගිණුම්

2.1 *ගිණුම් ඉදිරිපත් කිරීම* : – අංක 836 හා 1977 අගෝස්තු 16 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාර අරමුදල් සම්බන්ධ වාර්ෂික ගිණුම් ප්‍රකාශ අදාළ වර්ෂයට පසු වර්ෂයේ අප්‍රේල් 30 දිනට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුව ද, 2004 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අරමුදලේ ගිණුම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ වර්ෂ 1 මාස 3 ක ප්‍රමාදයකින් පසුව 2006 අගෝස්තු 7 දින දී ය.

2.2 *විගණන මතය* : – මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මාගේ උපරිම තොරතුරු සහ මට සපයන ලද පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා අති කරුණුවලින් ඇතිවන බලපෑම් හැර, පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට සහ මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් අංක 4 හි දක්වා ඇති ගණකාධිකරණ ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත්, එමගින් 2004 දෙසැම්බර් මස 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වයෙහි සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලවල සහ මුදල් ප්‍රවාහයේ සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන බව මාගේ මතය වේ.

2.3 *ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම*

2.3.1 *ගණකාධිකරණ අඩුපාඩු* :
පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය විය :

(*අ*) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු ආයෝජන ආදායම් මත වූ බදු රු. 12,366,029 ක් සමාලෝචිත වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේ දී සැලකිල්ලට ගෙන නොතිබුණු අතර පෙර වර්ෂය වෙනුවෙන් ගෙවන ලද රු. 10,860,504 ක් වූ ආයෝජන ආදායම් මත බදු වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත කර තිබිණි.

(*ආ*) සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම රු. 509,340 කින් වැඩියෙන් දක්වා තිබුණි. මේ හේතුව නිසා වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වේ.

(*ඇ*) 2003 වර්ෂයේ ලැබී තිබුණු රු. 4,584,060 ක් වූ ආයෝජන ආදායම් සමාලෝචිත වර්ෂයේ ලැබීම් ලෙස සටහන් කර තිබුණි. එම ආදායමට අදාළව ගෙවන ලද රු. 509,340 ක් වූ බදු වර්ෂයේ වියදම් ලෙස දක්වා තිබුණි. මේ හේතුව නිසා වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වේ.

(*ඈ*) 1990 ජනවාරි 01 දිනට සාවද්‍ය හර හා බැර එකිනෙකට හිලව් වූ ශේෂය, සාවද්‍ය බැර ලෙස රු. 2,794,066 ක් වූ අතර, 1990 සිට 2004 දක්වා ඉදිරිපත් කරන ලද අවසන් ගිණුම් අනුව සාවද්‍ය හර හා බැර ලෙස වෙන් වෙන් වශයෙන් එකතුව පිළිවෙලින් රු. 52,450,286,664 ක් හා රු. 52,439,120,527 ක් ඇත. මේ සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. මෙම ශේෂයන් ගිණුම්වල ඉදිරිපත් කරනු ලබනුයේ, 2004 දෙසැම්බර් 31 දිනට පවතින සාවද්‍ය හර හා බැර ශේෂයන් එකිනෙකට හිලව් කර රු. 8,372,071 ක සාවද්‍ය හර ශේෂයක් ලෙසිනි. සාවද්‍ය හර හා බැර ශේෂයන් නිරවුල් කිරීමට ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

2.3.2 *හර බැර නිවේදන ගෙන්වා ගැනීම* : – 1997 ජූලි 31 දිනැති අංක 1/97 දරන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් චක්‍රලේඛයේ 04 වගන්තිය ප්‍රකාර සෑම මාසයක් තුළම අරමුදලට හර හෝ බැර කරනු ලබන මුදල් පිළිබඳ නිවේදනයක් ඊළඟ මාසයේ 15 දිනට පෙර අරමුදලේ ලේකම් වෙත අදාළ ආයතන විසින් එවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා මෙම නිවේදන එවා තිබුණේ ආයතන 02 කින් පමණි. පෙර වර්ෂවල මෙන්ම සමාලෝචිත වර්ෂයේ දී ද එම නිවේදන ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් කාර්යක්ෂම හා ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.3.3 *දායක මුදල් ගෙවීම* : –විස්තරාත්මක අවකරණ ලේඛන අරමුදල වෙත ඉදිරිපත් කර නොතිබිය දී, ඒ ඒ අවස්ථාවේ දී සහතික කර එවන, අය වාර්තා පදනම් කරගෙන දායක මුදල් ගෙවීම් කරන අවස්ථා නිරීක්ෂණය වූ අතර එම ගෙවීම්වල නිවැරදිතාව පිළිබඳව විගණනයේ දී සෑහීමකට පත් විය නොහැක.

2.3.4 *විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම.* – පළාත් සභාවලට අයත් ආයතන 289 ක් පමණ පවතින නමුත්, 2004 වර්ෂයට අදාල දායක මුදල් ලැබීම් සම්බන්ධව පරීක්ෂා කිරීම සඳහා විගණනයට ඉදිරිපත් කරන ලද්දේ ලිපිගොනු 57 ක් පමණි. දායක මුදල් එවිය යුතු ආයතන සංඛ්‍යාව හා නම් වශයෙන් වෙන් වෙන්ව සොයා දැනගත හැකි පරිදි ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණ අතර දායක මුදල් එවනු ලබන ආයතන සම්බන්ධයෙන් පමණක් ලිපිගොනු පවත්වාගෙන ගොස් තිබුණි. මේ නිසා ලැබිය යුතු දායක මුදල් ප්‍රමාණය හා ඊට අදාලව ලැබිය යුතු ප්‍රසාද මුදල් කොපමණ ද යන්න විගණනයේ දී තහවුරු කර ගත නොහැකි විය.

2.3.5 *දායක මුදල් ගෙවීමේදී ගෙවනු ලබන පොලිය.* – පළාත් සභාවලට අයත් ආයතන මගින් දායක මුදල් සහ ප්‍රසාද මුදල් එවීමේදී බොහෝ විට ප්‍රමාදයන් සිදුවන බව ගිණුම් පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. නමුත් ආපසු ගෙවීම් කිරීමේදී එම මුදල් ලැබුණු දිනයන් නොසලකා මුදල් ලැබිය යුතු දිනයටම ලැබුණු ලෙස සලකා පොලී ගණනය කිරීම් සිදු කෙරේ. එහෙයින් නොලැබුණු මුදල් සඳහා අරමුදලින් පොලී ගෙවීම් සිදු කරනු ලබන බව නිරීක්ෂණය විය.

3. *මූල්‍ය හා මොහෙයුම් සමාලෝචනය :*

3.1 *මූල්‍ය ප්‍රතිඵල.* – ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලය රු. 974,530,714ක අතිරික්තයක් වූ අතර විසර්ජනයෙන් පසු මූල්‍ය ප්‍රතිඵලය රු. 8,250,877 ක අතිරික්තයක් විය. ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 864,186,258 ක අතිරික්තයක් වූ අතර විසර්ජනයෙන් පසුව මූල්‍ය ප්‍රතිඵලය රු. 1,219,923 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ විසර්ජනයෙන් පසුව මූල්‍ය ප්‍රතිඵලයේ රු. 7,030,954 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

3.2 *සාමාජික ගිණුම්වල ඇති ශේෂයන් දායකයින් වෙත දැනුම් දීම.* – රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පනතේ 25 වන වගන්තිය ප්‍රකාර එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් දෙසැම්බර් 31 දිනට සාමාජික ගිණුම්වල ඇති ශේෂයන් දායකයින් වෙත දැනුම් දිය යුතු වේ. 2004 දෙසැම්බර් 31 දිනට මෙම අරමුදලෙහි මුළු සාමාජික සංඛ්‍යාව 173,002 ක් වුවද, පොලිස් උපසේවා නිලධාරීන් 35,000 කට පමණක් 2004 දෙසැම්බර් 31 දින දක්වා ශේෂයන් පිළියෙල කර ඇති බව මා වෙත දන්වා ඇත. අවකරණ ලේඛන නොලැබීම සහ එක් එක් දායකයා සඳහා වෙනම ගිණුම් යාවත්කාලීනව පවත්වාගෙන නොයෑම හේතුවෙන් වර්ෂ ගණනාවක සිටම වර්ෂ අවසාන ශේෂය සාමාජිකයන් වෙත දැනුම් දීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. ක්‍රියාකාරී හා ක්‍රියාකාරී නොවන සාමාජිකයන් වෙන් වෙන්ව හඳුනාගත හැකි පරිදි සාමාජික ලේඛන යාවත්කාලීනව පිළියෙල කර නොතිබුණි.

3.3 *අයවැය ලේඛනමය පාලනය.* – 2004 මාර්තු 12 දින විගණනය වෙත ඉදිරිපත් කරන ලද 2004 වාර්ෂික අයවැය ලේඛනය, අංක 836 හා 1977 අගෝස්තු 16 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛයේ 4 ඡේදයේ විධිවිධාන වලට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

4. *පද්ධති හා පාලන*

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය :

(අ) අවකරණ ලේඛන ලබා ගැනීම,
(ආ) දායක මුදල් ගෙන්වා ගැනීම,
(ඇ) මුදල් පොත ඇතුළු ලේඛන හා පොත් පත් පවත්වාගෙන යාම,
(ඈ) සාවද්‍ය හර හා බැර ශේෂයන් නිරවුල් කිරීම.

පී. ඒ. පේමතිලක,
විගණකාධිපති.

2004.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව සම්බන්ධයෙන් රා.සේ.අ.අ. කළමනාකරණ මණ්ඩලයේ නිරීක්ෂණ

2.1 *ගිණුම් ඉදිරිපත් කිරීම ;*
නිරීක්ෂණය සම්බන්ධයෙන් එකඟ වෙමි.

2.3 *ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම ;*

2.3.1 *ගණකාධිකරණ අඩුපාඩු ;*

(අ) පෙර වර්ෂයන්හි සිටම ගිණුම් සකස් කිරීමේදී පොලිය සඳහා බදු මුදල් ගැලපීම සිදුකර ඇත්තේ සත්‍ය වශයෙන්ම පොලී මුදල් ලැබුණ වර්ෂයේ දී ය. මෙම අරමුදල ගොඩනැගී ඇත්තේ ඒකාබද්ධ අරමුදලින් වන බැවින්, ඒකාබද්ධ අරමුදලින් වැටුප් ලබන්නන්ගෙන් සමන්විත මෙම අරමුදල ආදායම් බද්දෙන් නිදහස් විය යුතු බැවින් මේ සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් වෙත ලිපි ඉදිරිපත් කර ඇති අතර, එවැනි බදු නිදහසක් බලාපොරොත්තුවෙන්, අවසාන ගිණුම් සකස් කිරීමේදී ලැබිය යුතු පොලී මුදල් සඳහා බදු වෙන් කිරීමක් සිදු නොකරන බව දන්වා සිටිමි.

(ඇ) 2003 වර්ෂයේ දී ලැබිය යුතු මෙම ආයෝජනය සම්බන්ධයෙන් පොලී බලපත්‍ර ලැබී තිබෙන්නේ 2004 වර්ෂයේ දී ය. එහෙත් 2003 වර්ෂයේ දී ගිණුම් සකස් කිරීමේදී රු. 5,093,400 (දළ අගය) ප්‍රමාණයක් ලැබිය යුතු පොලිය වශයෙන් 2003 වර්ෂයේ ආදායම් වියදම් ගිණුම් සකස් කිරීමේදී වර්ෂයේ ලාභයට ගලපා ඇත. 2004 වර්ෂයට අදාල ප්‍රමාණය 2004 වර්ෂයේ ආදායම් වියදම් ගිණුමට ගැලපීම් කර ඇත.

පොලී සඳහා අදාල වන බදු ඉහත 2.3.1(අ) සඳහන් කර ඇති පරිදි ගැලපීම් කර ඇති බව දන්වමි. එබැවින් මෙම නිරීක්ෂණය සම්බන්ධයෙන් එකඟ නොවෙමි.

(ඈ) සාවද්‍ය හර බැර සම්බන්ධයෙන් වෙනම ලේඛනයක් නඩත්තු කිරීමක් සිදු කර නොතිබුණත් එක් එක් වර්ෂයේ ශේෂය සකස් වී ඇති ආකාරය පිළිබඳව සවිස්තරාත්මක ගැලපුම් ගිණුමක් සිහිවටන ගිණුමක් වශයෙන් 2002 වර්ෂය දක්වාම වූ සෑම වර්ෂයක් සඳහාම ප්‍රධාන ලෙජරයේ පවත්වාගෙන ගොස් ඇත. එබැවින් වෙනම ලේඛනයක් සකස් කර නොමැත. 2003, 2004, වර්ෂ සඳහා සවිස්තරාත්මක ගැලපුම් ගිණුමේ පිටපත් මේ සමග අමුණා ඇති අතර, 2004.12.31 දිනට පවතින සාවද්‍ය හර හා බැර ශේෂ සඳහා වෙන් වෙන් වශයෙන් සකස් කරන ලද කාල විශ්ලේෂණය මේ සමග අමුණා ඇත. (ඇමුණුම් I, II, III, IV)

මෙම ශේෂයන් නිරවුල් කිරීම සඳහා දුරකථන ඇමතුම් මගින් සහ ලිපි මගින් අදාල දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වෙත දැනුම් දී ඇතත් මෙම ශේෂ නිරවුල් කිරීම සඳහා අදාල ආයතන කිසිම ප්‍රතිචාරයක් නොදක්වන බවද දන්වා සිටිමි.

2.3.2 *හර බැර නිවේදන ගෙන්වා ගැනීම*

නිරීක්ෂණ සම්බන්ධයෙන් එකඟ වෙමි.

2004 වර්ෂයේ සිට රා. සේ. අ. අ. සම්බන්ධ ගෙවීම් සියල්ලක්ම චෙක් පත් මගින් මෙම කාර්යාලයෙන් සිදු කරන බැවින් හර නිවේදන ගෙන්වා ගැනීමක් සිදු නොවේ. අරමුදලට කරන ලද සියලුම බැර කිරීම් නිවේදන ලබා දෙන ලෙස චක්‍රලේඛ, ලිපි හා දුරකථනය මගින් දෙපාර්තමේන්තු වලට හා අමාත්‍යාංශ වලට දැනුම් දී ඇතත්, වෙනම නිවේදනයක් එවන්නේ නැති අතර, චෙක් පත් සමග හෝ වෙනත් ආකාරයකට ලැයිස්තුවක් ඇතුළත් කර අදාල මුදල බැර කිරීම සම්බන්ධව විස්තර මාසිකව දන්වා එවීම සිදු කරයි. එම ලැයිස්තු පදනම් කරගෙන ශේෂ සැසඳීම සිදු කරයි.

2.3.3 *දායක මුදල් ගෙවීම* : – සියලුම ගෙවීම් කරනු ලබන්නේ අවකරණ ලේඛන පදනම් කරගෙනයි. අවකරණ ලේඛන එවා නොමැති ආයතන වලට ගෙවීම් කරන අවස්ථාවේ දී එම වර්ෂයේ දී දායක මුදල් අයකර තිබේනම් ඒ සඳහා අදාල ආයතනයෙන් සහතික කරන ලද අය වාර්තාවක් ලබා ගෙන ගෙවීම් කරනු ලැබේ. එයට හේතුව නම් අවකරණ ලේඛන ලැබෙන්නේ වාර්ෂිකව නිසාය.

කෙසේ වෙතත් අවකරණ ලේඛන ලබා ගැනීමට අපහසු අවස්ථාවන්හිදී පමණක් සහතික කරන ලද අයවාර්තා පදනම් කරගෙන ගෙවීම් කිරීම සඳහා අරමුදලේ ලේකම් හා ගණකාධිකාරිට අනුමැතිය ලබා දීම 2005.08.24 දින අරමුදලේ පාලක මණ්ඩල රැස්වීමේදී සිදු කර ඇත.

2.3.4 *විගණනය සඳහා සාක්ෂි නොමැති වීම*

චෙක්පත් මගින් අරමුදලට දායක මුදල් එවන ආයතන සම්බන්ධයෙන් වෙනම ලේඛනයක් නඩත්තු කරන අතර, ඒ සඳහා පළාත් සභා ආයතන, වෙනත් ව්‍යාපෘති ආදිය ඇතුළත්ය. එක් එක් පළාත් සභාවට අයත් ආයතන වෙන් වෙන් වශයෙන් මෙම ලේඛනයේ සටහන් කිරීමක් සිදු කරයි. අරමුදලට දායක මුදල් ලැබෙන්නේ නම් පමණක් එම ආයතන වෙනුවෙන් අදාල තොරතුරු සටහන් කිරීම සිදු කරයි.

එමෙන්ම සියලුම දායක මුදල් ලැබීම් සම්බන්ධයෙන් වෙන වෙනම ලිපිගොනු 192 ක පමණ ප්‍රමාණයක් විෂය ලිපිකරුවන් විසින් භාවිතා කරන අතර එම ලිපිගොනු එදිනෙදා රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය බැවින් කොටසක් පමණක් විගණනය කිරීමේදී ලබා දී ඇති අතර, ඉතිරි ගොනු අවශ්‍ය වන්නේ නම් විගණනයට ලබා දීමට හැකියාව තිබුණි. ඒකාබද්ධ අරමුදලින් හැර වෙනත් අරමුදල් මගින් වැටුප් ලබන විදේශ ව්‍යාපෘති වැනි ආයතන පමණක් 12%ක කොටස ලබා දීම සිදු කරයි. 2004 වර්ෂයේ දී එම ප්‍රමාණය සමස්ත මුදල් ලැබීම් වලින් 0.5% ක් වැනි සුළු ප්‍රමාණයක් වන බවද දන්වා සිටිමි.

2.3.5 *දායක මුදල් ගෙවීමේදී ගෙවනු ලබන පොලිය.* – පළාත් සභා ආයතන මගින් අරමුදලට එවන දායක මුදල් සම්බන්ධයෙන් පවත්වාගෙන යන ලිපිගොනු හා ලේඛනය පදනම් කර ගෙන අවකරණ ලැයිස්තු උපයෝගි කරගෙන අරමුදලින් ප්‍රදානයන් කිරීම සිදු කරයි. එමෙන්ම අරමුදලට දායක මුදල් එවූ ආකාරය පිළිබඳව අදාල ආයතන විසින් ප්‍රදාන ඉල්ලුම් කිරීමේදී වෙනම වාර්තාවක් ද සකස් කර ඉදිරිපත් කරයි. එබැවින් අරමුදලට නොලැබුණ මුදල් සඳහා අරමුදලින් පොලී ගෙවීමක් සිදු නොවන බව දන්වා සිටින අතර රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පනතට අනුව සාමාජිකයන්ගේ ගිණුම් වල බැරට තිබෙන ශේෂ පදනම් කරගෙන පොලී ගෙවීම සිදු කරයි.

3. *මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය*

3.1 *මූල්‍ය ප්‍රතිඵල*

3.2 *සාමාජික ගිණුම් වල ඇති ශේෂයන් දායකයින් වෙත දැනුම් දීම* : – දැනට 1999 වර්ෂය දක්වා පමණක් ශේෂ දැනුම් දී ඇති අතර, නව පරිගණක වැඩ සටහනක් දැනට සකස් කරගෙන යන අතර ඉදිරියේ දී සියළුම සාමාජිකයන් සඳහා දත්ත ඇතුළත් කිරීම සිදු කර ශේෂයන් දන්වා යැවීමට කටයුතු කරන බව දන්වා සිටිමි. නිරීක්ෂණය සම්බන්ධයෙන් එකඟ වෙමි.

කේ. ඒ. තිලකරත්න,
රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් කළමනාකරණ
මණ්ඩලයේ සභාපති හා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්.

02-185

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

එන්(පීවීඑස්)33070.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "ස්ටාර්ලයිට් ලින් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2003.02.27 දින සංස්ථාපිත සමාගමක් වන ස්ටාර්ලයිට් ලින් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ස්ටාර්ලයිට් ලින් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජනවාරි මස 07 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

02-181

---

එන්(පීවීඑස්)40002.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "මෙඩි පාර්මසියුටිකල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2004.12.17 දින සංස්ථාපිත සමාගමක් වන මෙඩි පාර්මසියුටිකල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, මෙඩි පාර්මසියුටිකල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජනවාරි මස 07 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

02-182

---

එන්(පීවීඑස්)43751.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ලයිෆ්ටයිම් පාට්නර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්"හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2005.10.26 දින සංස්ථාපිත සමාගමක් වන ලයිෆ්ටයිම් පාට්නර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ලයිෆ්ටයිම් පාට්නර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජනවාරි මස 07 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

02-183

---

එන්(පීවීඑස්) 44955.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "හෝම්බේක් ට්‍රේඩිං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2006.02.09 දින සංස්ථාපිත සමාගමක් වන හෝම්බේක් ට්‍රේඩිං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, හෝම්බේක් ට්‍රේඩිං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජනවාරි මස 07 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

02-184

### මහජන බැංකුව -අනුරාධපුර ශාඛාව

### වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වන යෝජනාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.10.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

"අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් සෙනෙවිරත්න මුදියන්සේලාගේ දීපදු කුමාරි මහත්මිය විසින් සහතික කරන ලද 2006.10.11 දිනැති අංක 2288 දරන උකස්කරය ප්‍රකාර දෙනගමගේ ගුනරත්න සහ දෙනගමගේ ඉන්දික තුෂාර ගුනරත්න සහ කලුආරච්චිලාගේ කරුණාවතී සහ දෙනගමගේ තරංගා කුමාරි ගුනරත්න යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ රුපියල් හාර ලක්ෂයක (රු.4,00,000) මුදලක් දැනට මහජන බැංකුවට ගෙවීමට ඇති බැවින් ද, 2007.01.05 දින සිට සියයට විසිදෙක (22%) බැගින් රුපියල් හාරලක්ෂයක (රු.4,00,000) මුදලක් සඳහා වෙන්දේසි දින දක්වා තවදුරටත් පොලිය සහ වෙන්දේසි ගාස්තු ඇතුලුව වෙනත් ගාස්තු ඇත්නම් ඒවා ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් හාරලක්ෂය (රු.400,000) ක මුදලක් අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 2288 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරයි".

#### දේපල පිළිබඳ විස්තරය

උතුරු මැද පළාතේ, අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාතේ, කනදරා කෝරළේ, කඳු තුලානේ ඥාණිකුලම පිහිටා තිබෙන අංක 262 දරන අවසාන ගම් පිඹුරේ කැබලි අංක 172 දරන බිම් කැබැල්ලට මායිම්, උතුරට : අ.ග.පි. 262 හි කැබලි අංක 171 ද, නැගෙනහිරට : අ. ග. පි. 262 හි තම්මැන්නාකුලම ගම් මායිම ද, දකුණට : අ. ග. පි. 262 හි කැබලි අංක 173 ද, බස්නාහිරට : අ. ග. පි. 262 හි කැබලි අංක 173 ද, යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් තුනයි දශම පහයි බින්දුවයි දෙකක් (හෙක්. 3.502) විශාල ඉඩමෙන් (අනුරාධපුර කොට්ඨාසයේ මිනුම් අධිකාරි විසින් සහතික කරන ලද අංක 262/86.03.21 වන දින දරන අවසාන ගම් පිඹුරේ අංක. 172 දරන බිම් කට්ටියෙන්) බෙදා වෙන් කරන ලද අංක 34 දරන බිම් කැබැල්ලට මායිම්, උතුරට : මෙම ඉඩමේ අංක 32 සහ 31 දරන බිම් කැබලි ද, නැගෙනහිරට : මෙම ඉඩමේ අංක 23 දරන බිම් (ප්‍රවේශ මාර්ගය) කැබැල්ල ද, දකුණට : මෙම ඉඩමේ අංක 35 දරන බිම් කැබැල්ල ද, බස්නාහිරට : ඥාණිකුලම අවසාන ගම් පිඹුර අංක 262 ද, යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හේක්ටයාර් බින්දුවයි දශම එකයි බින්දුවයි එකක් (හෙක්. 0.101) විශාල ඉඩම සහ ඊට අයිති ගසකොළ සහ පළතුරු ආදී සෑම සියලු දේ ද, එකී අංක 262 දරන අවසාන ගම් පිඹුරේ ප්‍රවේශ මාර්ග ලෙස සඳහන් අංක 177, 180, 183, 193, 206, 211 දරන කැබලි පාවිච්චි කිරීමේ මාර්ග අයිතිය ද වේ.

ඉහත කී දේපල සඳහා නැවත බලයලත් මිනින්දෝරු ඒ. එම්. බී. රත්නසිරි මහතා විසින් 1998.04.15 වන දින මැන බෙදා සාදන ලද අංක 205 දරන පිඹුරට අනුව කැබලි අංක 02 දරන කොටසට මායිම්, උතුරට : අ.ග.පි. 266 හි කැබලි අංක 31 සහ 32 ද, නැගෙනහිරට : අ. ග. පි. 266 හි කැබැලි අංක 23 ද, දකුණට : අ.ග.පි. 266 හි කැබලි අංක 35 ද, බස්නාහිරට : මෙම පිඹුරේම කැබලි අංක 01 දරන කොටසද, යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් බින්දුවයි දශම එකයි බින්දුවයි එකක් (හෙක්. 0.101) විශාල ඉඩම සහ ඊට අයිති ගස කොළ සහ පළතුරු ආදී සෑම සියලු දේත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අනුරාධපුරය.

02-224

---

### මහජන බැංකුව - ගාල්ල කොටුව 013

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.11.23 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

"ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් සහතික කරන ලද 2006.10.11 දිනැති අංක 955 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් පට්ටිය බණ්ඩාරගේ ලයනල් යන අයවලුන් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දස ලක්ෂයක (රු.10,00,000) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2007.04.12 දින සිට වර්ෂයකට 20.5% බැගින් රුපියල් දස ලක්ෂය (රු.10,00,000) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද, සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දස ලක්ෂයක (රු. 10,00,000) මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 955 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි".

#### දේපල පිළිබඳ විස්තර

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ, ගාල්ල මහ නගර සභා සීමාවේ දෙද්දුගොඩ පිහිටි බ්‍රවුන්ස් පාරේ වරිපනම් අංක 33/6 දරන කජ්ජුගහ ලියද්දේ ඕවිට කට්ටිය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. බී. එස්. බන්දුල සිල්වා මහතා විසින් 1997.12.03 වන දින මැන සාදන ලද අංක 39/97 දරන පිඹුර ප්‍රකාර අංක 6 දරන කැබැල්ලට මායිම් : උතුරට - අංක 39/97 දරන පිඹුරේ අංක 5 දරන කැබැල්ල ද, නැගෙනහිරට අඩි 20 ක් පළල පාර ද, දකුණට කජ්ජුගහ ලියද්ද ඕවිට ද, බස්නාහිරට - බම්බවත්ත ඕවිට වෙන්වූ අගල ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තිස් හයයි දශම පහයි එකක් (අ. 0 රූ. 0 පර්. 36.51) විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි යනාදී සියළු දේ ද වේ. මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 646/178 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහළ ඩික්සන් පාර,
ගාල්ල.

02-223

## මහජන බැංකුව

### වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වන යෝජනාවයි

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.10.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් සෙනෙවිරත්න මුදියන්සේලාගේ දීපදු කුමාරි මහත්මිය විසින් සහතික කරන ලද 2004.11.19 දිනැති අංක 1412 දරන උකස්කරය ප්‍රකාර දෙනගමගේ ගුණරත්න සහ දෙනගමගේ ඉන්දික තුෂාර ගුනරත්න යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ රුපියල් තුන් ලක්ෂ පනස් දහස (රු.350,000) ක මුදලක් දැනට මහජන බැංකුවට ගෙවීමට ඇති බැවින් ද 2007.01.05 දින සිට සියයට දහඅටයි දශම දෙකයි පහ (18.25%) බැගින් රුපියල් තුන්ලක්ෂ පනස් දහස (රු.350,000) ක මුදලක් සඳහා වෙන්දේසි දින දක්වා තවදුරටත් පොලිය සහ වෙන්දේසි ගාස්තු ඇතුළුව වෙනත් ගාස්තු ඇත්නම් ඒවා ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් තුන් ලක්ෂ පනස් දහස (රු. 350,000)ක මුදලක් අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 1412 දරන උකස්කරය යටතේ සහ අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් සෙනෙවිරත්න මුදියන්සේලාගේ දීපදු කුමාරි මහත්මිය විසින් සහතික කරන ලද 2005.12.09 දිනැති අංක 1814 දරන උකස්කරය ප්‍රකාර දෙනගමගේ ගුනරත්න සහ දෙනගමගේ ඉන්දික තුෂාර ගුණරත්න සහ කලු ආරච්චිගේ කරුණාවතී යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් දහසය ලක්ෂ හතලිස් හයදහස් හයසිය හැටහයයි ශත හැත්තෑදෙක (රු.1,646,666.72) ක මුදලක් දැනට මහජන බැංකුවට ගෙවීමට ඇති බැවින් ද 2007.01.27 දින සිට සියයට දහසය (16%) බැගින් රුපියල් දහසය ලක්ෂ හතලිස් හයදහස් හයසිය හැටහයයි ශත හැත්තෑ දෙක (රු.1,646,666.72) ක මුදලක් සඳහා වෙන්දේසි දින දක්වා තවදුරටත් පොලිය සහ වෙන්දේසි ගාස්තු ඇතුලුව වෙනත් ගාස්තු ඇත්නම් ඒවා ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් දහසය ලක්ෂ හතලිස් හයදහස් හයසියහැට හයයි ශත හැත්තෑදෙක (රු.1,646,666.72) ක මුදලක් අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 1814 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරයි.

අංක 1415 සහ 1814 දරන උකස් කර ප්‍රකාර උකස් කර ඇති දේපල පිළිබඳ විස්තර පිලිවෙලින්

උතුරු මැද පළාතේ, අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාත, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කනදරා කෝරලේ, අංක 239 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කුඩා පාලාඩිකුලම නමැති ගමේ පිහිටා ඇත. 239 ග්‍රාම නිලධාරි විසින් සම්පාදිත අංක 239/1 දරන රේඛා සටහනේ අංක 28 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇති රජයේ ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට අංක 239/1 දරන රේඛා සටහනේ ඩී. පබෝදාවතීගේ ඉඩම, නැගෙනහිරට : අංක 239/1 දරන රේඛා සටහනේ කුඹුරු යාය, දකුණට : අංක 239/1 දරන රේඛා සටහනේ එන්. බී. ඒ. හරිශ්චන්ද්‍ර, එන්. බී. ඒ. පියරත්න හා එන්. බී. ඒ. විජේසේකරගේ ඉඩම බස්නාහිරට : අංක 239/1 දරන ඩේසි මල්ලිකාගේ ඉඩම, යන මෙකී මායිම් තුළ පිහිටා ඇති ප්‍රමාණයෙන් අක්කර දෙකයි, රූඩ් නැත, පර්චස් නැත (අක්. 02, රූඩ් 0, පර්. 0) විශාල ඉඩම සහ ඊට අයත් ගසකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් වේ. ඉහත කී දේපළ නැවත බලයලත් මානක නිලධාරි, ඒ. එම්. බී. රත්නසිරි මහතා විසින් 1996.09.30 වන දින මැන සාදන ලද අංක 007 දරන පිඹුරේ කැබලි අංක 01 ට අනුව මායිම්, උතුරට : ඩී. පබෝදාවතී යන අයගේ ඉඩමද, නැගෙනහිරට : මෙම පිඹුරේ කැබැලි අංක 02 දරන කුඹුරු ඉඩම් ද, දකුණට : එන්. බී. ඒ. පියරත්න, එන්. බී. ඒ. හරිශ්චන්ද්‍ර, එන්. බී. ඒ. විජේසේකර එම්. ජේමාවතී යන අයගේ ඉඩම් ද, බස්නාහිරට : භාතිය මාවත සහ ඩේසි මල්ලිකාගේ ඉඩමද, යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකයි, රූඩ් නැත, පර්චස් නැත (අක්. 2, රූ. 0, පර්. 0) විශාල ඉඩම සහ ඊට අයත් ගසකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් වේ.

උතුරු මැද පළාතේ, අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කනදරා කෝරලේ, අංක 239 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කුඩා පාලාඩිකුලම නමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 239/1 දරන රේඛා සටහනේ අංක 46 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇති රජයේ ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : අ.ග.පි. 239/1 රේඛා සටහනේ මල්වතුඔය පාර, නැගෙනහිරට : අ.ග.පි. 239/1 රේඛා සටහනේ නුවර පාර, දකුණට : අ. ග. පි. 239/1 රේඛා සටහනේ ඒ. ප්‍රේමලාල්ගේ ඉඩම, බස්නාහිරට : අ. ග. පි. 239/1 රේඛා සටහනේ වැව රක්ෂිතය යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකක් (අක්. 01, රූඩ් 0, පර්. 0)ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සෑම සියලු දේත් වේ.

ඉහත කී දේපළ සඳහා බලයලත් මිනින්දෝරු කේ. කේ. වින්නයියා මහතා විසින් 2005.03.29 වන දින මැන සාදන ලද අංක 115 දරන පිඹුරෙහි දැක්වෙන කැබලි අංක 1 ට මායිම්, උතුරට : පාර (ප්‍රාදේශීය සභා), නැගෙනහිරට : පාර (ප්‍රධාන), දකුණට : ප්‍රේමලාල් ගේ ඉඩම, බස්නාහිරට : කැබලි අංක 02 යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එක (අක් 01, රූඩ් 0, පර්.0) ක් විශාල ඉඩම සහ එහි පිහිටි සෑම සියලු දේත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අනුරාධපුරය.

02-225

---

## මහජන බැංකුව - අනුරාධපුර ශාඛාව

### වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වන යෝජනාවයි

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.10.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් සෙනෙවිරත්න මුදියන්සේලාගේ දීපදු කුමාරි මහත්මිය විසින් සහතික කරන ලද 2007.01.22 දිනැති අංක 2443 දරන උකස්කරය ප්‍රකාර සෙම්බකුට්ටිගේ රංජිත් ප්‍රේමනාත් යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් නවලක්ෂ අනූඅටදහස් හාරසිය විසිඅටයි ශත තිස්තුන (රු.998,428.33) ක මුදලක් දැනට මහජන බැංකුවට ගෙවීමට ඇති බැවින් ද 2007.03.09 දින සිට සියයට දහඅටයි දශම පහ (18.5%) බැගින් රුපියල් නවලක්ෂ අනූඅටදහස් හාරසිය විසි අටයි ශත තිස්තුන (රු.998,428.33) ක මුදලක් සඳහා වෙන්දේසි දින දක්වා තවදුරටත් පොලිය සහ වෙන්දේසි

ගාස්තු ඇතුලුව වෙනත් ගාස්තු ඇත්නම් ඒවා ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් නවලක්ෂ අනූඅටදහස් හාරසිය විසි අටයි ශත තිස්තුන (රු.998,428.33) ක මුදලක් අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 2443 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරයි.

### දේපල පිළිබඳ විස්තරය

උතුරු මැද පළාතේ, අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාත, ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, නුවරගම් කෝරළේ, අංක 258 ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ, පොතානේගම නමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල් වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක 55 දරන පිඹුරේ අංක 190 දරන බිම් කට්ටියට මායිම්, උතුරට : අංක 191 දරන බිම් කැබැල්ලද, නැගෙනහිරට : පාර රක්ෂිතය සහ අංක 189 දරන බිම් කැබැල්ලද, දකුණට : අංක 189 දරන බිම් කැබැල්ල සහ රජයේ කැළයද, බස්නාහිරට : අංක 191 දරන බිම් කැබල්ලද, යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් බින්දුවයි දශම දෙකයි හයයි හය (හෙක්. 0.266) ක් විශාල ඉඩම සහ ඊට අයිති ගසකොළ සහ පළතුරු ආදී සියළු දේත් වේ.

ඉහත කී දේපළ සඳහා බලයලත් මිනින්දෝරු ලියනගේ සිරිපාල මහතා විසින් 2000.03.06 වන දින මැන බෙදා වෙන්කර සාදන ලද අංක 705 දරන පිඹුරේ කැබලි අංක 02 දරන කොටසට මායිම්, උතුරට : කැබලි අංක 01 සහ පාර, නැගෙනහිරට : කබැලි අංක 189, දකුණට : කැබලි අංක 189 සහ කැබලි අංක 01, බස්නාහිරට : කැබලි අංක 01 යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් බින්දුවයි දශම එකයි බින්දුවයි එකයි දෙකක් (හෙක්. 0.1012) ක් විශාල ඉඩම සහ ඊට අයිති ගසකොළ සහ පළතුරු ආදී සැම සියලු දේත් වේ.

මෙම දේපළ අනුරාධපුර ඉඩම් කාර්යාලයේදී අංක එල්. ඩී. ඕ. 48/81 සහ එල්. ඩී. ඕ. 48/153 දරන පත්‍ර්ගුරුවේ ලියාපදංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අනුරාධපුරය.

02-226

---

## මහජන බැංකුව - කල්පිටිය ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.10.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් රුවිනි ඒ. එස්. දසනායක මහත්මිය විසින් සහතික කරන ලද 2005.08.30 දිනැති අංක 3103 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, මොහොමඩ් කාසිම් මොහොමඩ් නියාස් මයා/ කල්අඩි පිච්චෙයි අහමදු ජලාල් මයා යන අයවලුන් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරයන් යටතේ දැනට රුපියල් හාරලක්ෂ විසිඑක්දහස් අටසිය හැත්තෑපහයි (රු.421,875) ක මුදලක් අයවීමට ඇති බැවින්ද 2007.05.12 දින සිට වර්ෂයකට 18.5% බැගින් රුපියල් හාරලක්ෂ විසිඑක්දහස් අටසිය හැත්තෑපහයි (රු.421,875) ක මුදල සඳහා පොලිය ද, වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී රුපියල් හාරලක්ෂ විසිඑක්දහස් අටසිය හැත්තෑපහයි (රු421,875) ක මුදල අයකර ගැනීම සඳහා මීගමුව බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතා විසින් එකී අංක 3103 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපල පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කොටසට අයත්, කල්පිටිය කෝරලේ, කල්පිටිය පත්තුවේ, කන්දකුලිය නමැති ගමේ පිහිටි කන්දකුලී තෝට්ටම් නමැති ඉඩමට, වී. වික්නේශ්වරම් බලයලත් මානක තැන විසින් වර්ෂ 2004.12.31 වන දින මැන සාදන ලද අංක 0753 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 දරන කොටසට මායිම්, උතුරට : අංක. පි. පි. පු. 3169 දරන පිඹුරේ ලොට් අංක 50 දරන කොටසද, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් අංක 60 දරන කොටස ද, දකුණට : ප්‍රාදේශීය සභා පාර ද, බස්නාහිරට : ඉහත කී පිඹුරේ ලොට් අංක 58 දරන කොටස ද, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර බින්දුවයි, රූඩ් එකයි, පර්චස් තිස්හයයි දශම හතයි (අක්. 0, රූඩ් 01, පර්. 36.7) ක් විශාල ඉඩමට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සැම සියලු දේත් මේ සමග වේ.

මෙම ඉඩම පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Q 120/152 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර - හලාවත.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79 - මාරවිල පාර,
නාත්තන්ඩිය.

02-227

---

## මහජන බැංකුව - බටපොල

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී(29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.10.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් සහතික කරන ලද 2006.04.06 දිනැති අංක 586 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්

වඩුමේස්ත්‍රි සුමිත් ප්‍රියන්ත යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දස ලක්ෂය (රු.1,000,000) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2006.09.29 දින සිට වර්ෂයකට 20.5% බැගින් රුපියල් දස ලක්ෂය (රු. 1,000,000) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දස ලක්ෂය (රු. 1,000,000) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 586 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**දේපල පිළිබඳ විස්තරය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ බටපොළ පිහිටි විතාරණගෙවත්ත *නොහොත්* උතුරු නැගෙනහිර කඩේවත්තේ අංක 1 දරන කැබැල්ල නැවත බෙදා වෙන් කළ කැබලි අංක 1 ඒ දරන කැබැල්ලට බලයලත් මානක කේ. කන්නන්ගර මහතා විසින් 2004.08.08 දින මැන සම්පාදිත අංක 957/2004 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : ආරච්චිගෙවත්ත ද, නැගෙනහිරට : කැබලි අංක 1 බී ද, දකුණට : ප්‍රධාන පාර ද, බස්නාහිරට : හෙන්දහේවා විජේදාස හිමිකම් කියන ඉඩමද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් පහයි දශම හතරයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 5.40) ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි ඇතුළු සියලු දේද වේ. මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 804/42 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22,
පහල ඩික්සන් පාර,
ගාල්ල.

02-228

---

**මහජන බැංකුව - බොරුල්ල ශාඛාව (078)**

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත පරිදි වූ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත පරිදි වූ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007 ක් වූ ඔක්තෝබර් මස 26 වන දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩී. ආර්. මෙන්ඩිස් විසින් සහතික කරන ලද වර්ෂ 2004 ක් වූ දෙසැම්බර් මස 30 වන දිනැති අංක 2139 දරන මහජන බැංකුව නමට ඇති උකස් බැඳුම්කරය ප්‍රකාරව ගෙවීම් කිරීම පැහැර හැර ඇති අතර දැනට එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 5, හැව්ලොක් පාර අංක 116/3 දරන ස්ථානයේ පිහිටා ඇති 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ වර්ෂ 1999 ක් වූ පෙබරවාරි මස 28 වන දින එන් (පීවීඑස්) 23127 යටතේ ලියාපදිංචි කර ඇති ප්‍රොටෙස් පී ඇන්ඩ් එල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම විසින් පැහැර හැර ඇති බැවින්, එකී අංක 2139 දරන උකස් බැඳුම්කරය යටතේ දැනට රුපියල් මිලියන දෙකකුත් පන් ලක්ෂයක (රු.2,500,000) මුදලක් මහජන බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇත. වර්ෂ 2006 ක් වූ නොවැම්බර් මස 07 වන දින සිට එක් වර්ෂයකට සියයට දහනවයයි දශම දෙකයි පහක (19.25%) ක් බැගින් ද, වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සමග අනතුරුව කිසියම් ගෙවීමක් (කිසිවක්) ලැබී ඇත්නම් ඒවා අඩු කිරීමෙන් පසුව වැඩිදුර පොළිය ද සමග එකී රුපියල් දෙමිලියන පන් ලක්ෂයක (රු.2,500,000) මුදල සහ ගාස්තු ද සමග එකී මුදල් අයකර ගැනීම පිණිස කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින්, එකී අංක 2139 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුව වෙත උකස් කරන ලද දේපල සහ පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1986 අංක 32 දරන පනතින් සංශෝධිත පරිදි වූ 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනී.

**දේපළ පිළිබඳ විස්තරය**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය කෝරළේ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, "අඳවෙලයාය ග්‍රාමය" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ මැනුම්පතිවරයා විසින් සාදන ලද අංක 70 දරන මූලික පිඹුරේ "ලොට් අංක 2491" වශයෙන් සලකුණු කර නිරූපිත බෙදා වෙන් කර ඇති ඉඩම් කැබැල්ලේ බදු අයිතිවාසිකම එකී "ලොට් අංක 2491" ට මායිම්, උතුරට : මූලික පිඹුර අංක 70 හි ලොට් අංක 2492 ද, නැගෙනහිරට මූලික පිඹුර අංක 70 හි ලොට් අංක 2492 ද දකුණට : මූලික පිඹුර අංක 70 හි ලොට් අංක 2490 ද, බස්නාහිරට : මූලික පිඹුර අංක 70 හි ලොට් අංක 2490 ද වන ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් එකයි දශම දෙකයි එකයි හතරක් (හෙක්. 1.214) වන එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ පලතුරු සහ සියලුම දේද සමග වේ. මෙය මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 41/18 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කලාප - 01).

මහජන බැංකුව,
කලාපීය ප්‍රධාන කාර්යාලය, (බටහිර කලාප - 01)
අංක 11, ආදිපාද වීදිය, කොළඹ 01.

02-230

---

**මහජන බැංකුව - දික්වැල්ල ශාඛාව**

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.08.23 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් සහතික කරන ලද 2004.07.13 දිනැති අංක 323 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කුනන්ගේ සුගුණවතී, සුජීවා එල්සි ජයසිංහ, සහ සුජිත් සාගර ජයසිංහ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය අංක 323 යටතේ රුපියල් හයලක්ෂ පනස් අටදහස් හයසිය විසි එකයි ශත පනස්

හතරක (රු.6,58,621.54) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2006.12.31 දින සිට වර්ෂයකට සියයට දහඅටයි දශම දෙකයි පහ (18.25%) බැගින් රුපියල් හයලක්ෂ පනස් අටදහස් හයසිය විසි එකයි ශත පනස් හතරක (රුපියල් 6,58,621.54) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29 "එල්" වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද, සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව රුපියල් හයලක්ෂ පනස් අට දහස් හයසිය විසිඑකයි ශත පනස් හතරක (රු.6,58,621.54) මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 323 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපල පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ වත්තේගම පිහිට කඩවරවත්ත නමැති ඉඩමේ මාතර දිස්ත්‍රික් උසාවියේ අංක P7889 දරන බෙදුම් නඩුව ප්‍රකාර එම නඩුවට ගොනු කර ඇති එන්. විජේවීර බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 2614ඉ හා 1986.05.25 දරන ප්ලෑන ප්‍රකාර බෙදා වෙන් කරන ලද අංක 08 දරන ඉඩම් කැබැල්ලට එම ප්ලෑන ප්‍රකාර මායිම් ඊසානට : මෙම ඉඩමේ බෙදා වෙන් කල අංක 09 දරන කැබැල්ලද, ගිණිකොනට : මාතර සිට දික්වැල්ලට යන ර. වැ. දෙ. පාරද , නිරිතට : මෙම ඉඩමේ බෙදා වෙන් කරන ලද අංක 8 ඒ දරන කැබැල්ලද, වයඹට : කඩවරවත්ත අද්දර කොරටුව ද මායිම් වන පර්චස් දොළහකුත් දශම නවයයි අටක් (අක්. 0, රූ. 0, පර්. 12.98) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි වැව්ලි ගොඩනැගිලි යනාදී සියළු දැය ද වේ.

මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B459/312 හි ලේඛනගතව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ප්‍රාදේශීය කළමනාකරු - මාතර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 38, 1/ඒ,
පිට්ටනිය පාර,
මාතර.

02-231

---

### මහජන බැංකුව - ලකී ප්ලාසා ශාඛාව

#### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.10.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. ආර්. එස්. අබේරත්න මහත්මිය විසින් සහතික කරන ලද 2007.02.14 දිනැති අංක 2037 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම සීමාසහිත නිව් සිලෝන් ජේම්ස් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම යන අය විසින් පැහැර හැර ඇති බැවින්, එකී අංක 2037 දරන උකස්කරය යටතේ දැනට රුපියල් දහඅට ලක්ෂයක (රු.18,00,000)ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින්, එම මුදල සහ එකී රුපියල් දහඅට ලක්ෂයක (රු. 18,00,000) මුදල සඳහා 2007.04.30 දින සිට වර්ෂයකට 23% බැගින්ද, වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල් අයකර ගැනීම සඳහා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. ආර්. එස්. අබේරත්න මහත්මිය විසින් 2007.02.14 දින නිකුත් කල අංක 2037 දරන උකස්කරය යටතේ බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන්, කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ කුඩාගල්බඩ කෝරළේ කුරුණෑගල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ කුරුණෑගල නගර සීමාව තුළ අංක 10 දරන පොල්අත්තාපිටිය කොට්ඨාසයේ හා බමුණු ගෙදර (කොටසක්) ගමෙහි පිහිටි සර්වෙයර් ජනරාල් වෙනුවට කුරුණෑගල කොට්ඨාසය භාර මැනුම් අධිකාරි එච්. එම්. කරුණාරත්න මහතා විසින් සහතික කරනු ලැබූ 1986.06.27 දිනැති අංක කු 1372 දරන මූලික පිඹුරෙහි දක්වා ඇති උතුරුවැව පාරේ වරිපනම් අංක 38 දරන 'ලේක්සයිඩ් වත්ත' නමැති ඉඩමෙන් බෙදා වෙන් කරනු ලැබූ අංක 106 දරන බිම් කැබැල්ල නම් වූ, උතුරට : මෙම ඉඩමේ කැබලි අංක 87 සහ 86 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ කබලි අංක 85, සහ 107 ද, දකුණට : පර (ගම්සභා) ද සහ බස්නාහිරට : මෙම ඉඩමේ කැබලි අංක 105 ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි පහයි එකක් (හෙ. 0.051) ක් විශාල මුළු ඉඩම් කැබැල්ල හා එහි තුළ පිහිටි සියළුම දේ හා එක අංක කු. 1372 දරන මූලික පිඹුරෙහි ප්‍රවේශ මාර්ග ලෙස දක්වා ඇති අංක 39, 41, 46, 57, 83, 109 දරන බිම් කැබලි පාවිච්චි කිරීමේ මාර්ග අයිතියද වේ. කුරුණෑගල ඉඩම් කාර්යාලයේ A1136/278 Cහි ලියාපදිංචිව ඇත.

ඉහත සඳහන් ඉඩම නව මිනුමකට අනුව පහත සඳහන් පරිදි විස්තර වේ.

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ කුඩාගල්බඩ කෝරළේ කුරුණෑගල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ කුරුණෑගල නගර සීමාව තුළ අංක 10 දරන පොල්අත්තාපිටිය කොට්ඨාසයේ හා බමුණු ගෙදර ගමෙහි පිහිටි ඒ. ජේ. සෙනෙවිරත්න මිනින්දෝරු මහතා විසින් සහතික කරනු ලැබූ 2005.08.25 දිනැති අංක 05/86 දරන පිඹුරෙහි දක්වා ඇති අංක 01 දරන බිම් කැබැල්ල නම් වූ, උතුරට : මෙම ඉඩමේ කැබලි අංක 87 සහ 86 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ කැබලි අංක 85 සහ 107 ද, දකුණට : පාර (ගම්සභා) ද සහ බස්නාහිරට : මෙම ඉඩමේ කැබලි අංක 105 ද, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 20.2) විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ, පලතුරු ආදී සියළු දේද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කලාප 01).

කලාපීය ප්‍රධාන කාර්යාලය,
(බටහිර කලාප 01),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

02-232

**සී/ස. හැටන් නැෂනල් බැංකුව – ඇඹිලිපිටිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සී/ස. හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

2007ක් වූ ඔක්තෝබර් මස 24 වන දින පවත්වන ලද සී/ස. හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

"රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එච්. කොස්ගොඩගේ විසින් සහතික කරන ලද්දාවූ ද සී/ස. හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 2004.02.03 දින හා අංක 190 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල ගෙවීම ඇන්ද්‍රා බදුගේ ආරියසේන සහ වහුම්පුරගේ විමලාවතී යන අයවළුන් ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ පනස්හයදහස් අටසිය හැටඅටයි ශත පහක (රු.2,56,868.05) මුදලක් 2006.08.31 දින වන විට සී/ස. හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 2,56,868.05ක මුදලට 2006.09.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොලිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 190 දරන උකස් බැඳුම්කරය මගින් සී/ස. හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපල සහ පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සී/ස. හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනාව සම්මත කර ගනී".

**උපලේඛනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්නේ කෝරළේ, දියපොටගම් පත්තුවේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා සීමාවේ, ඇඹිලිපිටිය උඩගම ගමේ කොන්කටුවෙහි පිහිටි "උක්වත්ත" (වඩාත් නිවැරදි ලෙස කෝන්ගහවත්ත *නොහොත්* "උක්වත්ත") දරන ඉඩමට බලයලත් මානක කේ. ජී. ධර්මරත්න විසින් මැන සාදන ලද 1999.08.23 දිනැති අංක 1296 දරන පිඹුරේ ලොට් 2 ලෙස සලකුණු කරන ලද ඉඩම් කොටසට උතුරට : බලයලත් මානක කේ. ජී. ධර්මරත්න විසින් මැන සාදන ලද පිඹුරු අංක 402 හි ලොට් 1න් ද, නැගෙනහිරට : බලයලත් මානක කේ. ජී. ධර්මරත්න විසින් මැන සාදන ලද පිඹුරු අංක 402 හි ලොට් 1න්ද, දකුණට : පිඹුරු අංක 402 හි ලොට් 3න්ද, බස්නාහිරට : පිඹුරු අංක 402 හි ලොට් අංක 4, (පාරෙන්) ද, මායිම් වූ රූඩ් තුනයි පර්චස් විසිහතයි දශම පහක් (අක්කර 0, රූඩ් 3 පර්චස් 27.5) විශාල ඇති පිඹුරු අංක 1296 දරන ඉඩම රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 193/180 යටතේ ලියාපදිංචි වී ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

02-277/1

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. – නුවර එළිය ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

2008ක් වූ ජනවාරි මස 10 වන දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

"මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2006.08.11 දින සහ අංක 947 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලොකුබදු ජයසූරිය පටබැඳිගේ පාලිත ජයසූරිය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ තිස්නවදහස් තිස්හතරයි ශත දාහතරක (රු.5,39,034.14) මුදලක් 2007.06.30 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 5,39,034.14ක මුදලට 2007.07.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොලිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 947 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී".

**ඉහත කී උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර, පාලිස්පත්තුවේ බටහිර කෝරළේ, ගොමගොඩ ගමෙහි පිහිටි කිරිවන කැටිය හේන දැන් වත්ත නමැති ඉඩමට (බලයලත් මානක පී. ජේ. විජේකෝන් විසින් මැන සාදන ලද අංක 162 සහ 2006 පෙබරවාරි මස 09 වන දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1 හි කොටසකින් සහ බලයලත් මානක පී. ජේ. විජේකෝන් විසින් මැන සාදන ලද අංක 184 සහ 2006 මාර්තු මස 15 වන දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 3හි කොටසකින් බලයලත් මානක පී. ජේ. විජේකෝන් විසින් මැන සාදන ලද අංක 223 සහ 2006 ජුනි මස 22 වන දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන

උතුරට සහ ඊසාන දිශාවට : මීටර් 3ක් පළලැති පාරක් සඳහා වෙන් කළ කොටසින් ද, ගිණිකොණ දිශාවට : ප්‍රධාන පාරේ සිට එස්ටේට් දක්වා දිවෙන පාරෙන් ද, දකුණට සහ නිරිත දිශාවට : ඊ. එම්. ටිකිරි බණ්ඩාට අයිති පොකුණ ඉඩමෙන් ද, බස්නාහිරට සහ වයඹ දිශාවට : එල්. බී. හේරත්ට අයිති ඩබ්. ඒ. පියදාස විසින් සාදන ලද පිඹුරු අංක 310/03/2005 ට අදාළ ලොට් 1න් ද, මායිම් වූ පර්චස් විස්සක් (අක්කර 0 රූඩ් 0 පර්චස් 20)

විශාල ඉඩම මහනුවර දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 799/199 වෙළුම/පත් ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

02-277/2

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. – නුවර එළිය ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

බුහර්ඩීන් මොහමඩ් නිලාම්

2008ක් වූ ජනවාරි මස 10 වන දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

" නුවරඑළිය ප්‍රසිද්ධ නොතාරිස් එන්. ටී. හේරත් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී.හි නමට ලියන ලද්දාවූ ද 1999.04.21 දින සහ අංක 3733 දරන බැඳුම්කරය යටතේ සහ නුවරඑළිය ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී හි නමට ලියන ලද්දාවූ ද 2003.02.25 දින සහ අංක 207 දරන බැඳුම්කරය යටතේ සහ නුවරඑළිය ප්‍රසිද්ධ නොතාරිස් ඒ. පී. කනපතිපිල්ලේ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී හි නමට ලියන ලද්දාවූ ද 2004.07.26 දින සහ අංක 3679 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම බුහර්ඩීන් මොහොමඩ් නිලාම් යන අය ණයකරු හැටියට,

පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දසලක්ෂ හතලිස්හයදහස් අටසිය නමයයි ශත හැටහයක (රු.10,46,809.66) මුදලක් 2007.10.31 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 10,46,809.66 ක මුදලට 2007.11.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොලිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 3733,207, සහ 3679 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී".

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර ආදායම් දිස්ත්‍රික්කයේ, ගම්පොල කොට්ඨාසය තුල උඩ පළාතේ, ගඟ පහල කෝරලේ, කහටපිටියෙහි පිහිටි "දවුලවේකුඹුර" දැන් "වත්ත" නමින් හඳුන්වන ලබන ඉඩමට බලයලත් මානක එච් ඩී. ජේ. කේ. පී. රොඩ්‍රිගෝ විසින් 1987.02.10 දින මැන සාදන ලද අංක 609 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ඉඩමට වයඹට : එම්. එල්. එම්. ෂකිරියාට අයිති මෙම ඉඩමේ ඉතිරි කොටසින් ද, ඊසාන දිගට : එම්. එල්. එම්. ෂකිරියාට අයිති දවුල්වේ කුඹුරෙන් ද, ගිණිකොණට : එම්. එල්. අබ්ඩා උම්මාට අයිති වරිපනම් අංක 202 දරන මෙම ඉඩමේ ඉතිරි කොටසකින් ද සහ නිරිත දිගට : අධිවේගී මාර්ගයෙන් මායිම් වූ පර්චස් හයයි දශම අටයි පහක් (අක්කර 0 රූඩ් 0 පර්චස් 6.85) විශාල ඉඩම සහ එහි ඇති සියළු දේත් සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

02-277/3

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කල්මුණේ ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008 ක් වූ ජනවාරි මස 10 දින පැවති හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

" කල්මුණේ ප්‍රසිද්ධ නොතාරිස් එම්. යූ. ටී. සෙයිනුඩීන් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද 1999.04.20 දින හා අංක 9473, 2000.02.21 දින සහ අංක 9766 2001.05.23 දින හා අංක 10127, 2004.07.30 දින හා අංක 10731 සහ 2005.05.05 දින හා අංක 10842 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මොහොමඩ් ඉබ්‍රහිම් මොහොමඩ් මෆූර් සහ මොහොමඩ් කාසිම් ජුනයිතා උම්මා යන අය ණයකරුවන් හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දසලක්ෂ හතලිස්නමදහස් දහහතයි ශත දහහතරක (රු.10,49,017.14) මුදලක් 2006.12.31 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 10,49,017.14 ක මුදලට 2007.01.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොලිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 9473,9766, 10127, 10731 සහ 10842 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී".

**උපලේඛනය**

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ කරෙයිවකු පත්තුවේ, කල්මුණේ, කොට්ඨාස 3 හි පිහිටි වෙරළ පාරේ, අංක 99 දරන කන්වුරයිඅඩිවලවු නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක සී. පද්මනාතන් විසින් මැන සාදන ලද 1999.03.21 දිනැති අංක 29/99 දරන පිඹුර ප්‍රකාරව උතුරට : එම්. වයි. සරා උම්මාට අයිති වත්තෙන් ද දකුණට : මාතවන් පාරෙන් ද, නැගෙනහිරට ; එම. බී. බැසිලඋම්මාට අයිති වත්තෙන් ද බටහිරට : වෙරළ පාරෙන් ද, මායිම් වූ පර්චස් දහතුනයි දශම අටයි පහක් (අ0, රූ0, පර්. 13.85) විශාල ඉඩම සහ එහි පිහිටි නිවස, ලිඳ සහ සියළු දේත් සමග වේ. මෙය කල්මුණේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ 24/88 යටතේ ලියාපදංචි වී ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

02-277/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.